| D03 | 192.248.154.128 | 255.255.255.224 | **192.248.154.128 – 192.248.154.159**<br>**192.248.154.129 - 192.248.154.158** |
| D04 | 192.248.154.160 | 255.255.255.224 | **192.248.154.160 – 192.248.154.191**<br>**192.248.154.161 - 192.248.154.190** |
| D05 | 192.248.154.192 | 255.255.255.224 | **192.248.154.192 - 192.248.154.223**<br>**193.248.154.193 - 192.248.154.222** |
| D06 | 192.248.154.224 | 255.255.255.224 | **192.248.154.224 – 192.248.154.255**<br>**192.248.154.225 - 192.248.154.254** |


**Two other possible entries for any of the department:**

PAPERMASTER.LK

(b) XYZ සමාගම නිෂ්පාදන, විකුණුම්, අලෙවි, පරිපාලන සහ නඩත්තු යන දෙපාර්තමේන්තු පහ තොරතුරු තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුවට සම්බන්ධ කර, එම දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හරහා අන්තර්ජාලයට සම්බන්ධ කරයි. රැහැන් අතුරා, ස්විච හයක්, මාර්ගකාරකයක් (router) සහ ගිනි පවුරක් (firewall) ස්ථාපනය කර ජාලය සම්පූර්ණ කර ඇත. දෙපාර්තමේන්තු හය වෙන වෙනම ගොඩනැගිලි හයක ස්ථාන ගත වී ඇත. ජාල පරිපාලක විසින් සියලු ම උපජාලවලට, නියෝජන සේවාදායකයක් (proxy server) හරහා අන්තර්ජාලයට ප්‍රවේශ වීමට ඉඩ සලසා ඇත. නියෝජන සේවාදායකය සහ DNS සේවාදායකය තොරතුරු තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුවෙහි ස්ථාපනය කර ඇත.

සියලු ම ස්ථාන සඳහා සුදුසු උපක්‍රම හා අවශ්‍ය රැහැන් හඳුනා ගනිමින්, XYZ සමාගමෙහි පරිගණක ජාලයෙහි තර්කණ සැකැස්ම නිරූපණය කිරීමට, නම් කරන ලද ජාල රූපසටහන අඳින්න.

(b) Network diagram





- Placing switches correctly and labeling.
- ස්විච නිවැරදිව ස්ථානගත කිරීම සහ නම් කිරීම

**[2 marks]**

- Connecting switches with cables and naming correctly
- ස්විච රැහැන් සමග නිවැරදිව සම්බන්ධ කිරීම සහ නම් කිරීම

- **[0.5 + 0.5 marks]**




- Placing DNS server and Proxy server in the correct place
- DNS සේවාදායකය සහ නියෝජන සේවාදායකය නිවැරදිව ස්ථානගත කිරීම

- **[0.5 + 0.5 marks]**


- **[ 1 mark]**

PAPERMASTER.LK





- Placing router and firewall in the correct place and connecting them
- මාර්ගකාරකය සහ ගිනි පවුර නිවැරදිව ස්ථානගත කිරීම සහ එක්නෙකා සම්බන්ධ (යා) කිරීම

- **[1 mark]**




- **Showing the connection to the Internet**
- අන්තර්ජාල සම්බන්ධය පෙන්වීම

**[1 mark]**




(c) ජාලය සැකසීමෙන් අනතුරුව සමාගමෙහි ඕනෑම දෙපාර්තමේන්තුවක ඕනෑම සේවකයකුට තම දෙපාර්තමේන්තුවෙහි පරිගණකයක ඇති වෙබ් අතරික්සුවක් මගින් ඒකාකාරී සම්පත් නිශ්චායකය http://www.nie.lk වන වෙබ් අඩවියට සාර්ථකව පිවිසිය හැකි විය. එසේ නමුදු එක්තරා දිනයකදී එක් සේවකයෙක් තම දෙපාර්තමේන්තුවෙහි පරිගණකයකින් එම වෙබ් අඩවියට ප්‍රවේශ වීමට නොහැකි බව දැන ගනියි.
ඉහත ගැටළුවට තුඩු දිය හැකි හේතු **තුනක්** ලියා දක්වන්න.

- o DNS is not working (down)
- o Proxy Server down
- o Change the proxy settings
- o Internet Link is not working (down)
- o Switch is broken / No power for the switch
- o Router is not working
- o Cable damage / Cables not properly connected
- o Network card of the computer is not working
- o Computer is not properly connected to the network
- o TCP/IP configuration of the machine is wrong

PAPERMASTER.LK

- NIE Server down

- DNS සේවාදායකය අක්‍රිය වීම
- නියෝජන සේවාදායකය අක්‍රිය වීම
- නියෝජන සිටුවම් වෙනස් කිරීම
- අන්තර්ජාල සම්බන්ධය බිඳ වැටීම
- ස්විචය අක්‍රිය වීම හෝ ස්විචයට විදුලි බලය විසන්ධි වීම
- මාර්ගකාරකය අක්‍රිය වීම
- රැහැන් කැඩී යාම හෝ නිසි ලෙස සම්බන්ධ නොවී තිබීම
- ජාල කාඩ්පත ක්‍රියා නොකිරීම
- පරිගණකය නිසි ලෙස ජාලයට සම්බන්ධව නොතිබීම
- TCP/IP වින්‍යාසයෙහි දෝෂයකි
- NIE සේවාදායකය බිඳ වැටී ඇත

**1 correct – 1 mark**
**2 correct – 1.5 marks**
**3 correct – 2 marks**
**maximum 2 marks]**
**[TOTAL FOR Q2 15 MARKS]**

3. (a) ශ්‍රී ලංකාවේහි එක්තරා නගරයක ඇති ව්‍යාපාරයක් ලී වෙස් මුහුණු, අතින් සාදනු ලබන සිහිවටන, බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි වැනි අත්කම් භාණ්ඩ සංචාරකයන්ට අලෙවි කරයි. දැනට පාරිභෝගිකයින් විසින් සාප්පුවට පැමිණ, මුදල් ගෙවා භාණ්ඩ මිලදී ගනු ලැබේ. හිමිකරු තමන්ගේම වෙබ් ද්වාරයක් මගින් මාර්ගගතව තම භාණ්ඩ අලෙවි කිරීමට සැලසුම් කරයි.

(i) ව්‍යාපාර හිමිකරු විසින් ආරම්භ කිරීමට සැලසුම් කරනු ලබන e-ව්‍යාපාර ආකෘති (e-business model) වර්ගය සඳහන් කරන්න.

B2C/Business to Consumer/Business to Customer

**[1 mark]**

(ii) ආසන්නයේ පිහිටා ඇති එක්තරා සංචාරක හෝටලයක් එහි වෙබ් අඩවියෙහි මෙම සැලසුම් කරන ලද මාර්ගගත සාප්පුව ප්‍රසිද්ධ කිරීමට කැමැත්ත පළකරන්නේ යැයි උපකල්පනය කරන්න.

(I) මෙම සංසිද්ධියට අදාළව අත්කම් භාණ්ඩ ව්‍යාපාරය සහ හෝටලය අතර කුමන e-ව්‍යාපාර ආකෘතියක් ස්ථාපනය කළ හැකි වන්නේ ද?

B2B/Business to Business

**[1 mark]**

PAPERMASTER.LK

(2) හෝටලය සහ අත්කම් භාණ්ඩ ව්‍යාපාරයෙහි යෝජිත මාර්ගගත සාප්පුව යන **එකිනෙක** සඳහා e-ව්‍යාපාර ආදායම් ආකෘතියක් (revenue model) බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

Hotel: Hotel can earn revenue by <u>displaying handy craft business's advertisement</u> on their web site and channeling traffic to the handicraft business site. (Advertising/affiliate revenue model)

හෝටලය: තම වෙබ් අඩවියෙහි <u>අත්කම් භාණ්ඩ ව්‍යාපාරයෙහි ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කර</u>, අත්කම් භාණ්ඩ ව්‍යාපාරය වෙත හෝටලයෙහි වෙබ් අඩවියෙන් අන්තර්ජාලය ඔස්සේ සිදුවන ගමනාගමනය මත ආදායමක් ලැබිය හැකිය. (ප්‍රචාරක ආදායම් ආකෘතිය)

**[1 mark]**

Handicraft Business: Proposed e-business portal can earn revenue by <u>sale of products</u>. (Sales revenue model)

අත්කම් භාණ්ඩ ව්‍යාපාරය: යෝජිත e-ව්‍යාපාර ද්වාරය මගින් සිදුකෙරෙන <u>භාණ්ඩ අලෙවියෙන්</u> ආදායම් ලබාගත හැකිය. (අලෙවි ආදායම් ආකෘතිය)

**[1 mark]**

(iii) සැලසුම් කරන ලද e-ව්‍යාපාරයෙහි මාර්ගගත ගෙවීම් සැකසීම සඳහා භාවිත කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

<u>Payment gateways (using credit cards/debit cards/using electronic payment cards online) /third party electronic payment processors such as PayPal/online fund transfer/using online banking fund transfer, can be used to process electronic payments via e-business portal.</u>

<u>ගෙවීම් කිරීමේ ද්වාර</u> (ණය පත්/හර පත්/ඉලෙක්ට්‍රොනික ගෙවීම් පත් භාවිතයෙන්)/ PayPal වැනි <u>තෙවන පාර්ශ්වයක්</u> මගින් ගෙවීම් කිරීම/මාර්ගගත මුදල් මාරු කිරීම/ e-ව්‍යාපාර ද්වාරය මගින් ඉලෙක්ට්‍රොනිකව ගෙවීම් කිරීමට අවස්ථාව සැකසීම

**[2 marks]**

(iv) සැලසුම් කරන ලද e-ව්‍යාපාර වෙබ් ද්වාරය සඳහා පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමට ඔබ විසින් යෝජනා කරනු ලබන e-අලෙවිකිරීමේ (e-marketing) එක් ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

<u>Social media campaign</u> (via Facebook, Twitter etc.)/ <u>email campaign</u> (direct mailing)/<u>SMS campaign</u>/<u>advertising in other websites</u> can be used to attract users to the proposed site/<u>search engine marketing</u>

PAPERMASTER.LK

(Facebook, twitter වැනි) සමාජ (මාධ්‍ය) ජාල ඔස්සේ ප්‍රයත්නය/විද්‍යුත් තැපෑල (සෘජු තැපෑල/කෙටි පණිවුඩ) මගින් ප්‍රයත්නය/වෙනත් වෙබ් අඩවි ඔස්සේ ප්‍රචාරය වැනි ක්‍රම මගින් යෝජිත වෙබ් අඩවියට පාරිභෝගිකයන් ආකර්ශනය කල හැකිය./සෙවුම් යන්ත්‍ර ඔස්සේ අලෙවි කිරීම

**[Correct method 1 mark, explanation 1 mark**

**=2 marks]**

(v) සැලසුම් කරන ලද e-ව්‍යාපාර වෙබ් ද්වාරයේ පරිශීලක අත්දැකීම් (user experience) වැඩි දියුණු කිරීම සඳහා බුද්ධිමත් ඒජන්ත (intelligent agent) තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න.


Intelligent agent technology can be used to suggest customer preferred products by analyzing customer behavior on site/ intelligent search functions can be provided to help user search through the products. /for product recommendations on the site

බුද්ධිමත් ඒජන්ත තාක්ෂණය භාවිතයෙන් වෙබ් අඩවිය තුල පාරිභෝගිකයාගේ හැසිරීම් රටා විශ්ලේෂණය කර පාරිභෝගිකයා වඩා කැමති නිෂ්පාදන යෝජනා කිරීම/බුද්ධිමත් සෙවීමේ ශ්‍රිත භාවිතයෙන් භාණ්ඩ ඔස්සේ පාරිභෝගිකයාට භාණ්ඩ සෙවීමේ පහසුව සැලසීම/වෙබ් අඩවිය තුල භාණ්ඩ නිර්දේශ කිරීමෙන්

**[Keyword 1 mark, proper explanation 2 mark}**

**[3 marks]**

(b) බහු-ඒජන්ත (multi-agent) පද්ධතියක සරල කරන ලද දසුනක් දැක්වෙන පහත රූපසටහන සලකන්න.




ඉහත රූපසටහන අධ්‍යයනය කර, පහත දැක්වෙන ප්‍රශ්නයට පිළිතුර සපයන්න.
"මෘදුකාංග ඒජන්තවරයකුට පරිශීලක අතුරු මුහුණතක් තිබීමට හෝ නොතිබීමට හෝ පිළිවන."
ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? රූපසටහන ආශ්‍රයෙන් හේතුවක් දක්වන්න.

PAPERMASTER.LK

Yes,

**[1 mark]**

as illustrated in the diagram an agent software has the ability to communicate with the user via the user interface (agent A and User)as well as the other agents as well as the in a multi-agent environment(agent A and Agent B without user interaction (self-autonomous)).

ඔව්, රූප සටහනෙහි දක්වා ඇති පරිදි ඒජන්ත මෘදුකාංගයකට පරිශීලක අතුරුමුහුණතක් මගින් පරිශීලක සමග සන්නිවේදනය කිරීමේ හැකියාව ඇති (ඒජන්ත A සහ පරිශීලක) අතර බහු ඒජන්ත පරිසරයකදී වෙනත් ඒජන්තවරු සමග සන්නිවේදනය කිරීමේ හැකියාව ද ඇත (ඒජන්ත A සහ ඒජන්ත B).

**[Agent user communication - 1.5, agent -agent communication 1.5 = 3 marks]**

**{Total for 3(b) = 4 marks}**


**[TOTAL FOR Q3 15 MARKS]**

4. (a) ධන සංඛ්‍යා අනුක්‍රමයක් ඇති ආදානයක් සලකන්න. අනුක්‍රමයට උපරිම වශයෙන් සංඛ්‍යා 100ක් තිබිය හැකි ය. $n < 100$ ලෙස අනුක්‍රමයට සංඛ්‍යා $n$ තිබේ නම්, $(n + 1)$ වන සංඛ්‍යාව $-1$ ලෙස සලකුණු කිරීමෙන් අනුක්‍රමයේ අවසානය දැක්වේ. උදාහරණයක් ලෙස පහත දැක්වෙන ආදාන අනුක්‍රමයට ධන සංඛ්‍යා 8ක් ඇති අතර 9 වන ආදානය වන $-1$ මගින් අවසානය සනිටුහන් කෙරේ.

23 12 54 76 89 22 44 65 −1

ඉහත විස්තර කරන ආකාරයේ ධන සංඛ්‍යා $n$ ඇති අනුක්‍රමයක විශාලතම සංඛ්‍යාව ප්‍රතිදානය කිරීම සඳහා ඇල්ගොරිතමයක් ගැලීම් සටහනක් මගින් නිරූපණය කරන්න.

PAPERMASTER.LK




[Marks breakdown:

Correctness of overall algorithm: 1 mark

3 decision elements must exist: 3 marks for correct use of them, as follows (or equivalent):

- "is x == -1?" → 1 mark (including correct Y and N connections)
- "is x > max?" → 1 mark (including correct Y and N connections)
- "is n < 100?" → 1 mark (including correct looping / Y and N connections)

Correct initialization of variables: 1 mark

Correct update of max: 1 mark

Correct input and output: 0.5 marks

"start" and "stop": 0.5 marks

Penalties applied after the above mark allocation:


if wrong flowchart symbols used, -1 for each wrong symbol]

PAPERMASTER.LK

{Total for part (a) 7 marks}

(b) දී ඇති ගැලීම් සටහන සලකන්න. ගැලීම් සටහනෙහි දැක්වෙන ඇල්ගොරිතමය ආදාන දෙකක් ලබාගන්නා අතර පළමු ආදානය වන L, සංඛ්‍යා ලැයිස්තුවක් ද, දෙවන ආදානය K, දෙන ලද සංඛ්‍යාවක් ද වේ.

(i) පළමු ආදානය (L) 23, 45, 32, 11, 67, 39, 92, 51, 74, 89 ද දෙවන ආදානය (K) 38 ද වූයේ නම්, ප්‍රතිදානය කුමක් ද?




False

**[1 mark]**

(ii) මෙම ඇල්ගොරිතමයෙහි අරමුණ කෙටියෙන් පැහැදිලි කරන්න.

Determine if K is in L / output True if K is in L, False otherwise

K , L හි තිබේ දැයි නිර්ණය කිරීම. K , L හි තිබේ නම් ප්‍රතිදානය සත්‍ය වන අතර එසේ නොවුන විට අසත්‍ය වේ.

**[2 marks No partial marks]**

PAPERMASTER.LK

(iii) ගැලීම් සටහනේ ඇති ඇල්ගොරිතමය ක්‍රියාත්මක කිරීම සඳහා පයිතන් ක්‍රමලේඛයක් ගොඩනගන්න.

Python program to implement the algorithm expressed by the flowchart.

```
# ListSearch.py(Python version 3.x program)
# input: L (a list of numbers), K (a number)
# output: "True" if K is in L, "False" otherwise
L = input("Enter the list of numbers:")
numList = [int(i) for i in L.split()] # or similar way
K = int(input("Enter K, item to search:"))
n = len(numList)
i = 0
while i < n:
    if (numList[i] == K):
        print("True")
        break
    i = i+1
if (not (i < n)):
    print("False")
```

**[Loop must exist with correct looping and exiting/aborting of loop → 1 mark**

**"if" must exist to compare each list element with K → 1 mark**

**Correct method to get input → 1 mark**

(0.5) **Correct method to output → 1 mark**

(0.5) **Overall correctness → 1 mark**

**Minor syntax errors will be ignored (not penalized)**

**Colon ":" and indentation are major (not minor) syntax]**

**[Total = 5 marks]**

**{Total for 4(b) 8 marks}**

**[TOTAL FOR Q4 15 MARKS]]**

PAPERMASTER.LK


5. පහත දැක්වෙන CLASS සහ STUDENT වගු දෙක, පහතයෙහි දී ඇති ER සටහන භාවිත කර නිර්මාණය කර ඇත.

**CLASS** වගුව

| ClassID | ClassName | ClassTeacher | Stream | Year |
|---|---|---|---|---|
| 1111 | 12 - A | A. B. Perera | Physical Science | 2017 |
| 1112 | 12 - B | N. Mohamed | Bio Science | 2017 |
| 1113 | 13 - A | E. Selvadurai | Arts | 2017 |
| 1114 | 13 - B | L. de Silva | Commerce | 2018 |

**STUDENT** වගුව

| IndexNumber | ClassID | Initials | Surname | DateOfBirth |
|---|---|---|---|---|
| 8991 | 1112 | E. | Nazeer | 1999.12.06 |
| 8993 | 1111 | S. | Sivalingam | 1999.02.06 |
| 8995 | 1112 | W. | Fernando | 1999.11.11 |
| 8997 | 1113 | U. H. | de Silva | 1999.08.06 |




(a) Ⓐ සහ Ⓑ ලෙස දක්වා ඇති CLASS සහ STUDENT යන භූතාර්ථ අතර සම්බන්ධතාවෙහි ගණනීයතාවය (cardinality) කුමක් ද? **සටහන:** Ⓐ සහ Ⓑ සඳහා සුදුසු ලේබල පිළිවෙළින් ලියා දක්වන්න.

A= 1, B=N (M) / one to many / 1:n/1:N

**[A, B labels optional; order mandatory**
**[1 mark X 2**
**= 2 marks]**

(b) ඉහත උදාහරණයෙහි ප්‍රාථමික යතුර/යතුරු සහ ආගන්තුක යතුර/යතුරු භාවිතයෙන් වගු දෙක අතර සම්බන්ධතාවයක් (relationship) ගොඩනැගෙන ආකාරය පැහැදිලි කරන්න.

Primary key ClassID of CLASS table is used as the foreign key in STUDENT table.

CLASS වගුවෙහි ප්‍රාථමික යතුර වන ClassID, STUDENT වගුවෙහි ආගන්තුක යතුර ලෙස භාවිත කෙරේ.

**[2 marks o partial marks]**

PAPERMASTER.LK

(c) (i) STUDENT සහ CLASS වගු දෙවන ප්‍රමත (2NF) ආකාරයෙන් පවතී ද? ඔබේ පිළිතුරට හේතුවක් වගු ඇසුරෙන් පැහැදිලි කරන්න.

Yes, ඔව්

**[1 mark]**

Both STUDENT and CLASS table are in 1NF as all fields are atomic and every non-prime attribute of each relation is fully functionally dependent on the primary key / primary key is not composite, hence all other attributes are fully functionally dependent on the primary key, and there are no partial dependencies / they are in 3NF as no transitive dependencies exists in addition to non composite primary key, hence in 2NF

STUDENT සහ CLASS වගු දෙකෙහි සියළුම ක්ෂේත්‍ර ඒකජ සහ එක් එක් සම්බන්ධයෙහි සෑම ප්‍රථමක නොවන උපලක්ෂණයක්ම ප්‍රාථමික යතුර මත පූර්ණ ලෙස කාර්යබද්ධව පරායත්ත වන බැවින්/ ප්‍රාථමික යතුර සංයුක්ත නොවන නිසා සහ අනෙකුත් සියළුම ක්ෂේත්‍ර ප්‍රාථමික යතුර මත පූර්ණ ලෙස කාර්යබද්ධව පරායත්ත වන අතර ආංශික පරායත්ත නොමැති බැවින්/ ප්‍රාථමික යතුර සංයුක්ත නොවීමට අමතර ලෙස සංක්‍රාන්තිකව පරායත්ත නොවන බැවින් මෙම වගු, 3වන ප්‍රමතකරනයෙහිද එනයින් 2වන ප්‍රමතකරකයෙහිද පවතී.

**{Identifying the keywords 2 marks**
**or**
**Complete explanation 3 marks**
**[4 marks]**

---

(ii) ප්‍රමතකරණයෙහි ප්‍රධාන **වාසියක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- Data integrity and consistency is maintained hence database is (Atomicity, Consistency, Isolation, Durability) ACID compliant
- no data duplication/ there is less chance of storing two or more different copies of the data/Smaller size database (By eliminating duplicate data, you will be able to reduce the overall size of the database
- Data integrity/no update, delete, insert anomalies/Data modification anomalies are reduced.
- Better performance faster access speed/ fewer indexes per table mean faster maintenance tasks such as index rebuilds/ Searching, sorting, and creating indexes is faster, since tables are narrower, and more rows fit on a data page
- Conceptually cleaner and easier to maintain and change database
- Updates run quickly due to no data being duplicated in multiple locations.
- Inserts run quickly since there is only a single insertion point for a piece of data and no duplication is required.
- Tables are usually smaller that the tables found in non-normalized databases. This usually allows the tables to fit into the buffer, thus offering faster performance.

PAPERMASTER.LK

- <u>දත්ත විස්වාසවන්ත බව</u> දත්ත සංඝත බව පැවතීම නිසා ACID සංකල්පයට (ඒකජ, සංඝත, වෙන්ව පැවතීම, කල්පැවැත්ම) එකඟ වේ.
- <u>දත්තවල අනුපිටපත් නොපිහිටයි</u>/දත්ත වල පිටපත් දෙකක් හෝ වැඩි ගණනක් තිබීමේ අවස්ථාව ඉතා අඩුය. / කුඩා ප්‍රමාණයේ දත්ත සමුදාය (අනුපිටපත් සහිත දත්ත තුරන්කරලීම නිසා දත්තපාදකයෙහි සමස්ත ප්‍රමාණය අඩු කර ගත හැකිවේ.)
- <u>දත්ත විස්වාසවන්ත බව/ දත්ත යාවත්කාලීන කිරීමේ, මැකීමේ, ඇතුල්කිරීමේ ව්‍යාකූලතා නොමැත. දත්ත වෙනස් කිරීමේ ව්‍යාකූලතා නොමැත.</u>
- වඩා හොඳ <u>කාර්යසාධනය</u>/ ප්‍රවේශ වේගය වැඩි බව/ වගුවකට ඇති අඩු දර්ශක හේතුකොට ගෙන නඩත්තුකිරීමේ කාර්යයන් වඩා කාර්යක්ෂම වීම (උදා: දර්ශක නැවත ගොඩනැංවීම වැනි)/දත්ත සෙවීමේ, තේරීමේ සහ දශීක නිර්මාණයේ කාර්යක්ෂමතාව, වගුවල පටු බව නිසා දත්ත පිටුවකට වැඩි පේළි ගණනක් ගැලපීමේ හැකියාව
- දත්ත සමුදාය සංකල්පිතව <u>වඩා නිරවුල් සහ කඩත්තු කිරීමේ පහසුව</u>
- බහුවිධ ස්ථානවල දත්ත අනුපිටපත් නොමැති නිසා දත්ත <u>යාවත්කිරීම් වඩා කාර්යක්ෂම වීම</u>
- <u>දත්ත ඇතුළත් කිරීමේදී</u> අනුපිටපත් නොකර එක් ස්ථානයකට පමණක් ඇතුළත් කිරීමට අවශ්‍ය බැවින් <u>වඩා කාර්යක්ෂම වීම</u>
- <u>වගු</u>, ප්‍රමතකරනය නොවූ වගු වලට වඩා සාමාන්‍යයෙන් <u>කුඩා</u> වේ. එනයින්, වගු අන්තරාවයට ගැලපීම විධිමත් නිසා ඉහළ කාර්යසාධනය

**[3 marks]**

**{Total for 5(b) 7 marks}**

(d) CLASS වගුවට පහත දැක්වෙන උපලැකියාව ඇතුළත් කිරීම සඳහා SQL ප්‍රකාශයක් ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1115 | 13 - C | A.B. Jinasena | Technology | 2018 |

INSERT INTO CLASS VALUES (1115, '13 – C', 'A.B. Jinasena', 'Technology', 2018);

or

INSERT INTO CLASS VALUES ('1115', '13 – C', 'A.B. Jinasena', 'Technology', '2018');

or

INSERT INTO CLASS (ClassID, ClassName, ClassTeacher, Stream, Year) VALUES ('1115', '13 – C', 'A.B. Jinasena', 'Technology', '2018');

PAPERMASTER.LK

or

INSERT INTO CLASS (ClassID, ClassName, ClassTeacher, Stream, Year) VALUES (1115, '13 – C', 'A.B. Jinasena', 'Technology', 2018);

**[Statement structure correct (Correct keywords + correct field names + correct values)**

**2 marks;**

**Overall completeness (Correct keywords + correct field names + correct values+ correct use of quotes (either ' or " )+ semicolon(Exact Answer))**

**2 mark]**

**no other forms of partial marks**

**=total 4 marks]**

**[TOTAL FOR Q3 15 MARKS**


PAPERMASTER.LK

6. (a) ජාතික පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය, පහත දැක්වෙන විස්තරය සහ දත්ත ගැලීම් සටහන ඇසුරෙන් පැහැදිලි කෙරේ.

අයදුම්කරු විසින් අදාළ පාසල වෙත අයදුම්පත්‍රය යවනු ලැබේ. පාසල විසින් අයදුම්පත්‍රය ලැබුණු බව අයදුම්කරුට දැනුම් දෙයි. අනතුරුව පාසල විසින් අයදුම්පත්‍රයෙහි ඇති තොරතුරුවල නිරවද්‍යතාව පහත දැක්වෙන පරීක්ෂා මඟින් තහවුරු කෙරේ.

- අයදුම්කරුගේ සුදුසුකම් : 'යෝග්‍යතා පටිපාටිය' යන දත්ත ගබඩාවෙන් ලබාගත් යෝග්‍යතා පටිපාටිය භාවිතයෙන්
- මැතිවරණ කොට්ඨාශයෙහි ලියාපදිංචිය : මැතිවරණ අධිකාරියෙන් ඡන්දදායක ලැයිස්තුව ඉල්ලා සිටීමෙන් (මැතිවරණ අධිකාරිය මඟින් ඡන්දදායක ලැයිස්තුව පාසලට යවනු ලැබේ.)
- පදිංචිය : පදිංචිය තහවුරු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලා සිටීමෙන් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පදිංචිය තහවුරු කර පාසල වෙත දැනුම් දෙයි.)

තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කිරීමෙන් පසු අයදුම්පත්‍රය පිළිගත් බව හෝ ප්‍රතික්ෂේප කළ බව හෝ අයදුම්කරුට දන්වනු ලබන අතර, ඒ බැව් සටහන් කළ අයදුම්පත්‍රය 'අයදුම්පත් විස්තර' දත්ත ගබඩාවෙහි සුරක්ෂිත කෙරේ. පාසල විසින් වලංගු අයදුම් පත් 'අයදුම්පත් විස්තර' දත්ත ගබඩාවෙන් ලබාගෙන, සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණවලට දින නියම කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අයදුම්කරුවන්ගේ ලැයිස්තුව අධ්‍යාපන අධිකාරිය වෙත යවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ කාලසටහන 'සම්මුඛ පරීක්ෂණ විස්තර' නම් දත්ත ගබඩාවෙහි සුරක්ෂිත කෙරේ.




**පළමුවන මට්ටමේ (level 1) දත්ත ගැලීම් සටහන**

ඉහත සංසිද්ධිය සඳහා පළමුවන මට්ටමෙහි දත්ත ගැලීම් සටහන, ඇතැම් දත්ත ගැලීම Ⓐ සිට Ⓚ දක්වා ලේබල සහිත ව ඉහත රූප සටහනෙහි දී ඇත.

අදාළ දත්ත ගැලීම් හඳුනාගෙන, Ⓐ සිට Ⓚ දක්වා එක් ලේබලය ඉදිරියෙන් ඒවා ලියා දක්වන්න.

**A**- Application,

**B**- Application Acknowledgement/Acknowledgement

**C**-Eligibility Criteria

**D**-Request/Application for Electoral List

PAPERMASTER.LK

**E**- Electoral List

**F**- Request/Application for Residential Status/Confirmation of Residence

**G**- Residential Status/Confirmation of Residence

**H**- Acceptance/Rejection Status

**I**- Interview Letter/Interview Date, Time (Venue)

**K**- Interview Schedule

**J** -Interview Schedule

A- අයදුම්පත්‍රය

B- අයදුම්පත්‍රය ලැබුන බව

C- සුදුසුකම් පටිපාටිය

D- ඡන්දදායක ලැයිස්තුව ඉල්ලීම

E- ඡන්දදායක ලැයිස්තුව

F- පදිංචිය තහවුරු කරන ලෙස ඉල්ලීම

G- පදිංචිය තහවුරු ~~කිරීම~~ කළ බව

H- පිළිගත්/ප්‍රතික්ෂේප කළ බව/තත්ත්වය

I- සම්මුඛ පරීක්ෂණයට ~~කැඳවීම~~/සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය/සම්මුඛ පරීක්ෂණ දිනය, වේලාව, ස්ථානය

K- සම්මුඛ පරීක්ෂණ කාල සටහන

J - අයදුම්කරුවන්ගේ ලැයිස්තුව

**[Each correct ½ mark = 5 ½**

**+ ½ for completeness (all 11 are correct)**

**= 6 marks]**

(b) (i) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයෙහි භාවිත වන කාර්යබද්ධ (functional) සහ කාර්යබද්ධ නොවන (non-functional) අවශ්‍යතා අතර ප්‍රධාන වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

Functional requirements : Any requirement which specifies <u>what the system should do</u> or provide for users/ they <u>related to the technical functionality</u> of the system./ function is described as a <u>specification of behavior between outputs and inputs/ behavior (output)</u> that a device or software is expected to <u>exhibit</u> in the case of a certain <u>input./ desired operations of a software, or system</u>

PAPERMASTER.LK

- ◦ කාර්යබද්ධ අවශ්‍යතා: <u>පද්ධතිය කලයුතු වන්නේ කුමක්දැයි</u> හෝ ලබා දෙන්නේ කුමක්දැයි දැක්වෙන අවශ්‍යතා කාර්යබද්ධ අවශ්‍යතා වේ. කාර්යබද්ධ අවශ්‍යතා යනු පද්ධතියෙහි තාක්ෂණික කාර්යබද්ධතා ලෙස ද දැක්විය හැකිය/ආදාන ප්‍රතිදාන අතර හැසිරීමේ පිරිවිතර/උපක්‍රමයක් හෝ මෘදුකාංගයක් විසින් දෙනලද ආදානයකට ලබා දියයුතු ප්‍රතිදානය ප්‍රදර්ශනය කිරීම/මෘදුකාංගයකින් හෝ පද්ධතියකින් බලාපොරොත්තු වන මෙහෙයුම

- Non-functional requirements : Any requirement which specifies <u>how the system performs a certain function or system works</u> /They describe how, how well or to what standard a function should be provided /nonfunctional requirements describe the <u>general characteristics of a system</u>. They are also known as <u>*quality attributes*</u>. (Include service hours, service availability, responsiveness, throughput and reliability.)/define system attributes such as security, reliability, performance, maintainability, scalability, and usability

- කාර්යබද්ධ නොවන අවශ්‍යතා: කිසියම් කාර්යයකදී පද්ධතියෙහි <u>කාර්ය සාධනය කෙසේද? නැතහොත් පද්ධතිය ක්‍රියාකරන්නේ කෙසේද?</u> යන්න/ එමගින් (එනම් කාර්යබද්ධ නොවන අවශ්‍යතා මගින්) කොතරම් හොඳින් නැතහොත් කුමන ප්‍රමිතියකට කාර්යයක් සිදුවිය යුතුද? යන්න සැලකේ. / කාර්යබද්ධ නොවන අවශ්‍යතා පද්ධතියක <u>පොදු ලක්ෂණ</u> විස්තර කරයි. කාර්යබද්ධ නොවන අවශ්‍යතා පද්ධතියෙහි <u>තත්ත්ව උපලක්ෂණ</u> ලෙසද සැලකේ (උදා: සේවා පැය ගණන, සේවා ලබාදෙන ස්වභාවය, කොපමණ ද්‍රව්‍ය හෝ අයිතම ප්‍රමාණයක් පද්ධතිය තුලින් ගමන් කරන්නේද , ප්‍රතිචාර දැක්වීමේ ස්වභාවය, සහ විස්වාසවන්ත බව/ පද්ධත් උපලක්ෂණ, ආරක්ෂාකාරී බව, විශ්වාසවන්ත බව, කාර්යසාධනය, කඩත්තුකිරීමේ හැකියාව, මැනීමේ හැකියාව, භාවිතයේ පහසුව

**[2 *2 marks = 4 marks,**

**No partial marks less than 2 marks,**

**Total= 4 marks]**

(ii) නාමාවලියක (catalogue) ඇති භාණ්ඩ අලෙවි කිරීමට, යෝජිත e-වාණිජ්‍ය (e-commerce) වෙබ් ද්වාරයක තිබිය යුතු ඇතැම් කාර්යබද්ධ සහ කාර්යබද්ධ නොවන අවශ්‍යතා ලැයිස්තුවක් පහත දැක්වේ.

A - භාණ්ඩවල විවිධ සංලක්ෂණ (characteristics) පදනම් අනුව භාණ්ඩ සෙවීම සඳහා පරිශීලකට අවස්ථාව ලබා දීම

B - පද්ධතිය ඕනෑම වෙබ් අතරික්සුවක ක්‍රියා කළ යුතු වීම

C - පද්ධතිය පහසුවෙන් භාවිත කිරීමට හැකි වීම

D - භාණ්ඩ පිළිබඳ විචාරණ (comments) ඉදිරිපත් කිරීමට සහ වෙනත් පරිශීලකයන්ගේ විචාරණ කියවීමට පරිශීලකට අවස්ථාව ලබා දීම

E - පද්ධතිය බිඳ වැටීමක් හමුවේ වුව ද එහි දත්ත සුරක්ෂිත විය යුතු වීම

F - තමන් කැමති භාණ්ඩ පිළිබඳ පැතුම් ලැයිස්තුවක් (wish list) සාදා එය නඩත්තු කර පවත්වාගෙන යාමට පරිශීලකට අවස්ථාව ලබා දීම

G - නාමාවලියේ ඇති භාණ්ඩ බලා ගැනීමට පරිශීලකට අවස්ථාව ලබා දීම

H - පද්ධතිය දවසකට පැය 24 ම, සතියකට දින 7 ම හා වසරකට දින 365 ම භාවිත කළ හැකි වීම

I - පරිශීලක නාම හා මුරපද හරහා පරිශීලකයන්ගේ සත්‍යතාවය (authenticity) තහවුරු කිරීමට හැකි විය යුතු වීම

PAPERMASTER.LK

J - ලෝක ව්‍යාප්ත පරිශීලකයන් (උදා: ප්‍රංශ, ජපන්, ජර්මන් ආදි) සඳහා පද්ධතියේ අභිරුචි (customized) සංස්කරණ (versions) තිබිය යුතු වීම

| Nonfunctional requirements |
|---|
| B,C,E,H,J |

[Each correct 1 mark,

Each incorrect answer reduce 1 mark,
all written 0 marks

More incorrect answers than correct answers 0 marks

Total = 5 marks]

{Total for 6(b) 8 marks}

[TOTAL FOR Q6 15 MARKS]

****Important****

**Information for Chief Examiners of the panels: Please fill the following table and include any amendments made at the chief controllers meeting held on 9th September.**

**Check List**

| Question | Amended? ✓ | Amendment Made |
|---|---|---|
| 1. (a) | ☐ | |
| (b) | ☐ | |
| (c) | ☐ | |
| (d) | ☐ | |
| 2 (a) (i) | ☐ | |
| (ii) | ☐ | |
| (iii) | ☐ | |
| (iv) | ☐ | |
| (b) | | |

PAPERMASTER.LK